# මාන්තායි සෝල්ට් ලිමිටඩ්

# மாந்தை சோல்ட் லிமிட்டெட்

# MANTAI SALT LIMITED

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

கைத்தொழில் மற்றும் வணிக அமைச்சு

Ministry of Industry and Commerce

රජයට අයත් සමාගමකි

**அரசுக்குச் சொந்தமான கம்பனி**

**Government Owned Company**

## වාර්ෂික වාර්තාව සහ ගිණුම්

## ஆண்டறிக்கையும் கணக்குகளும்

## ANNUAL REPORT & ACCOUNTS

## 2014.04.01 – 2015.03.31

## පටුන

| මාතෘකාව | | පිටුව |
|---|---|---|


| | | |
|---|---|---|
| 1. | සභාපතිතුමාගේ පණිවිඩය | 01-02 |
| 2. | මහා කළමනාකාරතුමාගේ පණිවිඩය | 03-04 |
| 3. | සංස්ථා තොරතුරු | 05 |
| 4. | හැඳින්වීම | 06-08 |
| 4.1 | සමාගම හැඳින්වීම | 05-06 |
| 4.2 | නිෂ්පාදන අංශ පිළිබඳ තොරතුරු | 07-08 |
| 4.3 | නිෂ්පාදන තොරතුරු | 08 |
| 4.4 | විකුණුම් | 08 |
| 5. | සංවර්ධනය සිදුකරන ප්‍රධාන ප්‍රදේශ | 09-10 |
| 5.1 | සංවර්ධන කටයුතුවල ප්‍රගතිය | 10 |
| 6. | මූල්‍ය ක්‍රියාකාරිත්වයේ විශේෂ අවස්ථා | 11 |
| 7. | ප්‍රධාන කළමනාකාරිත්වය පිළිබඳ තොරතුරු | 12 |
| 8. | ආයතනික ව්‍යුහය | 13 |
| 8.1 | මාන්තයි ලුණු සමාගමේ වර්තමාන කාර්ය මණ්ඩලය | 14 |
| 9. | අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 15-16 |
| 10. | මාන්තයි ලුණු සමාගමේ කොටස් හිමියන් සඳහා ස්වාධීන විගණකගේ වාර්තාව | 17-19 |
| 11. | විගණනය කරන ලද මූල්‍ය වාර්තා 2015/2016 | 20-49 |

## 1. සභාපතිතුමාගේ පණිවිඩය

මන්තායි සෝල්ට් සමාගම සභාපතිවරයා ලෙස මා 2014/2015 වර්ෂය සඳහා සමාගමේ වාර්ෂික ගිණුම් පිළිබඳ මාගේ සමාලෝචනය මෙසේ ඉදිරිපත් කරමි. 2014/2015 සමාගමේ මහ සභා රැස්වීම සඳහා ඔබව පිළිගැනීමට සහ 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව හා ගිණුම් ඉදිරිපත් කිරීමට ලැබීම ගෞරවයකි.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ මාන්තායි සෝල්ට් සමාගම රු. 49,018,196 ක පිරිවැටුමක් වාර්තා කර ඇත. බද්දට පෙර ලාභය 5,206,287කි. ආරම්භයේ පටන් අපගේ කාර්ය සාධනය දෙස බැලීමේ දී අපගේ විකුණුම් ජයග්‍රහණ පිළිබඳව ආඩම්බර විය හැකිය. නිෂ්පාදන සහ වෙළෙඳ කටයුතුවල විශිෂ්ට වැඩිවීමක් 2014/2015 වර්ෂය තුළ පෙන්නුම් කරන අතර. අපේ සමාගම රු.3, 597,467 රජයට බදු සහ ප්‍රේෂණ වශයෙන් සහ ලාභාංශ ලෙස 235,025 මහා භාණ්ඩාගාරයට ගෙවීමෙන් සමාගම වාර්තාවක් තබා ඇත.

ශ්‍රී ලංකාව තුළ ජීව්‍ය ලුණු කර්මාන්තය දියුණු කිරීමට සහ තිරසාර පැවැත්ම සඳහා පහසුකම් සපයන්නා ලෙස කටයුතු කිරීමට සමාගමට හැකි වූ බව කොටස්කරුවන්ට ප්‍රකාශ කිරීමට ලැබීම ගැන මම සතුටු වෙමි. 2014/2015 වසර තුළ ලැබූ ප්‍රතිඵල අනුව, කොටසකට අදාළ ඉපැයුම රුපියල් 5.36කි.

වර්ෂය සඳහා අනුමතමුළු තනතුරු සංඛ්‍යාව 104 කි. 2015.03.31දිනට සේවක සංඛ්‍යාව 40 කි. සියලුම මට්ටම්වල සිටින සියලුම සේවකයින්ගෙන් අඛණ්ඩව පූර්ණ සහයෝගය ලබා ගැනීම පිළිබඳව මම සතුටට පත්වෙමි.

අපේක්ෂිත අරමුණු සාර්ථක ලෙස සපුරා ගැනීම සඳහා නව කොටස් සමකොටස් ප්‍රාග්ධනය(සහභාගාා)එකතු කිරීම තුළින් මන්තායිසෝල්ට් සමාගමේ වර්තමාන ප්‍රාග්ධන පදනම ශක්තිමත් කිරීමට අවශ්‍ය වේ.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය, රජයේ ආයතන මෙන්ම පාරිභෝගිකයන් විසින් අප වෙත ලබාදෙන අඛණ්ඩ දිරිගැන්වීම සහ සහයෝගය පිළිබඳව සතුටු වෙමු.

මන්තායිසෝල්ට් සමාගම සෑම අභියෝගයකටම මුහුණදීමට හා පාරිභෝගිකයින්ගේ අවශ්‍යතාවලට ක්ෂණිකව හා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට සූදානම්ව සිටින අතර එමගින් එහි අඛණ්ඩ සාර්ථකත්වය සහතික කරයි.

මෙම මුදල් වර්ෂය තුළ දී කළමණාකරණ මණ්ඩලයේ සහ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් මාහට ලබා දුන් සහාය සඳහා මාගේ අවංක ස්තුතිය පුද කරමි.

එම්.එම්.අමීන්

සභාපති

## 2. මහා කළමනාකාරතුමාගේ පණිවිඩය

මාන්තායි ලුණු සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමේදී මගේ පණිවුඩය ප්‍රකාශ කිරීමට ලැබීම උතුම් අවස්ථාවකි. මාන්තායි ලුණු සමාගම එහි ක්‍රියාකාරකම් සහකාර්යන් කාර්යක්ෂමව ඉටුකර 2014 අප්‍රේල් 01 වැනි දිනසිට 2015 මාර්තු 31 දින දක්වා කාලය තුළ ලාභ උපයා ඇත.

උතුරේ ලුණු ලේවායන් කිහිපයක් මන්තායි ලුණු සමාගම යටතේ පැවතිය ද විවිධ හේතූන් නිසා වර්තමාන මූල්‍ය වර්ෂය තුළ මන්නාරම් ලුණු ලේවාය පමණක් ක්‍රියාත්මක කිරීමට හැකිවිය.

පොදු සහ පෞද්ගලික හවුල්කාරිත්වය හරහා වෙම්මනි ලේවාය ජලජීවී වගා ව්‍යාපෘතියත් සඳහා නැවත භාවිතා කිරීම සඳහා අමාත්‍යාංශය හා මණ්ඩලය කටයුතු කර ඇත. 2015 ජනවාරි 15 වන දින අංක 1897/15 දරන විශේෂ ගැසට් නිවේදනය අනුව එලිෆන්ට් පාස් (අලිමංකඩ)ලුණු ලෙවායේ කළමනාකරණය මන්තායි ලුණු සමාගම යටතට පත්විය.

2014/2015 වර්ෂය තුළදී, අපේක්ෂිත ලුණු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 5500 වූ අතර මෙට්‍රික් ටොන් 5219 ක් නිෂ්පාදනය කිරීමට සමාගමට හැකි විය. සාමාන්‍ය ලුණු, අයඩීන් මිශ්‍ර කිලෝ ග්‍රෑම් 1 අඩංගු ලුණු, කාර්මික ලුණු සහ ලුණු කැට ලෙස මෙට්‍රික් ටොන් 5176.10 ක් අලෙවි කර අතර මුළු පිරිවැටුම රුපියල් මිලියන 49ක් වේ.මේ වසර සඳහා බදු ගෙවීමට පෙර සත්‍ය ලාභය රුපියල් 5,206,286.54 කි.

සාධාරණ මිලක් යටතේ ලුණු විකිණීමෙන් පාරිභෝගිකයින්ට සේවා සපයනවා පමණක් නොව රුපි. 3,597,467.00 ක් ආදායම් බදු ලෙස රජයට ගෙවීමෙන් සහ සාධාරණ ලාභාංශ ප්‍රමාණයක් රජයේ භාණ්ඩාගාරයට ලබා දී අපි ඉතා ආඩම්බරයට පත් වන්නෙමු.

මෙම කාලය තුළ එලිෆන්ට් පාස් ලුණු ලේවායේ I කොටසෙහි අළුත් වැඩියා කටයුතු වලින් 95% ක් අවසන් කරන ලදි. එලිෆන්ට් පාස් ලුණු ලේවාය සඳහා 2015 අයවැය තුළින් රුපියල් මිලියන 5 ක් ලැබුණු අතර ඉතිරිව පැවති නවීකරණ කටයුතු අවසන් කිරීමට හැකිවිය. උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම පිණිස මෙම ලුණු ලේවාය කාර්යක්ෂමව සහ කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය විසින් උපාය මාර්ගික සැලැස්මක් සකසා ඇත. 2016 වසරේ ජනවාරි මාසයේ මුල මෙම ලුණු නිෂ්පාදනය ආරම්භ කරන අතර පළමු වසර තුළ මෙට්‍රික් ටොන් 8000 ක අස්වැන්නක් අපේක්ෂා කෙරේ.

2020 දී 20% ක වෙළඳපොළ කොටසක් සහිතව ශ්‍රීලංකා ලුණු නිෂ්පාදනයේ එකම ප්‍රධානතම ලුණු නිෂ්පාදකයා බවට මන්තායි සෝල්ට් ලිමිටඩ් සමාගම පත්කිරීමට කළමනාකරණය අරමුණු කර ඇත.

මෙම මූල්‍ය වර්ෂයේදී දැනට සිටින කාර්ය මණ්ඩලයට විවිධාකාර වූ ක්‍රියාකාරකම් මගින්ඉලක්ක නියම කිරීමේ පුහුණු, අගය කිරීම්, මූලික පහසුකම් සඳහා ප්‍රතිපාදන,අතිරේක පහසුකම්(බෝනස්) ආදිය සඳහා විධිවිධාන සලසා ඇත.

අවසාන වශයෙන්,කර්මාන්තහා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය සහ මගේ කාර්ය මණ්ඩලය මෙම සමාගමේ සාර්ථකත්වයට ලබාදුන් හෘදයාංගම දායකත්වයට මම පෞද්ගලිකව ස්තූතිවන්ත වන්නෙමි.

එම්.ජේ.තුවාන් මනසිල්
මහා කලමනාකාර.

## 03. සංස්ථා තොරතුරු

| | |
|---|---|
| සමාගමේ නම | මන්තායි සෝල්ට් සමාගම (රජය සතු සමාගම) |
| රේඛීය අමාත්‍යාංශය | කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය |
| ප්‍රධාන කාර්යාලය | 561/3, ඇල්විටිගල මාවත,<br>කොළඹ 05. |
| මන්නාරම ලේවාය | ග්‍රෑන්ඩ් බසාර්,මන්නාරම. |
| අලිමංකඩ ලේවාය | A9 පාර,අලිමංකඩ,කිළිනොච්චි. |
| සමාගම් ලියාපදිංචි අංකය | [N(PBS)942] New No. PB1078 |
| බදු ගෙවන්නා හැඳින්වීම ටින් අංකය(TIN No.) | 134009420 |
| කොටස් හිමියෝ | මහා භාණ්ඩාගාරය |
| අධ්‍යක්ෂ මණ්ඩලය | ආර්.කේ.එම්. සිහිබ්ඩීන් මහතා (සභාපති) (2014.04.01 සිට 2014.10.30)<br>එම්.එම්.අමීන් මහතා (සභාපති) (2014.11.01 සිට 2015.03.31)<br><br>එම්.අයි.එම්.මොහොමඩ් මහතා(ක්‍රි. අධ්‍යක්ෂ) (2014.04.01 සිට 2014.10.30)<br>එම්.කේ.එම්.සහබ්දීන් මහතා(ක්‍රි. අධ්‍යක්ෂ) (2014.11.01 සිට 2015.03.30)<br><br>උපාලි ගුණවර්ධන මහතා (2014.04.01 සිට 2014.04.30)<br>ජේ.මාසෙලස් පීරිස් මහතා (2014.04.01 සිට 2014.04.30)<br>එස්.ආර්.ඩබ්.එම්.ආර්.පී.සත්කුමාර මහතා (භාණ්ඩාගාරය) (2014.04.01 සිට 2014.12.31)<br>පී.ඒ.එස්.ඒ. කුමාර මහාතා (භාණ්ඩාගාරය) 2015.03.01 සිට 2015.03.31)<br>එම්.එච්.එම්.නියාස් මහතා (2014.04.01 සිට 2014.04.30)<br>එම්.ආර්.සාලි මහතා (2014.11.01 සිට 2015.01.31)<br>එම්.එම්.එම් උවායිස් මහතා (2014.11.01 සිට 2015.03.31)<br>එම්.වී.එස්.ජයසූරිය මහතා(2014.11.01 සිට 2014.12.31) |
| නිරීක්ෂකයෝ | අයි.රණතුංග මිය (අධ්‍යක්ෂ-සමාගම්) (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය) |
| මණ්ඩලයේ ලේකම් | Corporate Affairs (Pvt) Ltd කෝපරේට් අෆ්යාර්ස් (ප්‍රයිවට්)ලිමිටඩ් |
| විගණකවරු | බී.ආර්.ඩී.සිල්වා සහ සමාගම<br>වරලත් ගණකාධිකාරිවරු,22/4 විජය කුමාරතුංග මාවත,කො 02. |
| බැංකුකරු | ලංකා බැංකුව |

# 4. හැඳින්වීම

## 4.1 සමාගම හැඳින්වීම

මන්තායි සෝල්ට් සමාගමට ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදනය සම්බන්ධව දිගු ඉතිහාසයක් ඇත. එය සාමාන්‍ය ලුණු, අයඩීන් මිශ්‍ර ලුණු, ලුණු කුඩු සහ කාර්මික ලුණු නිෂ්පාදනය කරයි. ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශය මන්නාරම වන අතර පරිපාලන කාර්යාලය කොළඹ පිහිටා ඇත. එලිෆන්ට් පාස් ලේවාය නැවතත් සමාගමට පැවරී ඇති අතර 2016 වර්ෂයේ මැද සිට නිෂ්පාදන කයාවලිය ආරම්භ වේ.

වර්ෂ 1938 දී ලුණු සමාගම ආරම්භ කරන ලද අතර එය විවිධ මය පාලනයන්ට යටත් විය. අවසානයේ එය 2001 වසරේ සිට මන්තායි සෝල්ට් සමාගම ලෙස නම් කර ඇති අතර වර්තමානයේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.රටේ අනෙක් පළාත්වල ලුණුඅස්වැන්නහා සැසඳීමේදී මෙම ලුණු ගුණාත්මකභාවයෙන් හොඳම ලුණු (97.% Nacl) ලෙස පිළිගනු ලැබේ.

මන්තයි ලුණු සමාගම ස්වාභාවික සම්පත් පරිහරණය කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස පමණක් නොව මන්නාරම දිස්ත්‍රික්කයේ අවදානමක් සහිත(පීඩිත) ජනතාව සඳහා රැකියා අවස්ථා ලබා දෙන මධ්‍යස්ථානයක් ලෙස ද කටයුතු කරයි. අද වන විට ස්ථිර සේවයේ නියුතු කාර්ය මණ්ඩලය 40ක් සහ සීමිත කාලයකට බඳවා ගත්(Seasonal Staff) කාර්ය මණ්ඩලය 40 ක් ආයතනය විසින් සේවයේ යොදවා ඇත.

මහා භාණ්ඩාගාරයේ සහ අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නියෝජිතයන්ගෙන් සමන්විත මණ්ඩලයක් විසින් මන්තයිසෝල්ට් සමාගම පාලනය කරනු ලබන අතර එය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට යටත් වේ. අමාත්‍යාංශයේ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය සමාගමේ නීතිමය හා වගකිවයුතු කරුණු නිරීක්ෂණය කිරීම සහ පහසුකම් සැපයීම සිදු කරයි. එය රජයේ ව්‍යවසායක් ලෙස 2007 අංක 7 දරන සමාගම පනත යටතේ සීමාසහිත සමාගමක් ලෙසසමාගම් නීති රීති වලට අනුකූල ව ලියාපදිංචි වී ඇත. මේ අතර, අගය එකතු කළ භාණ්ඩයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සහතික කරනු ලැබේ.එසේම මහා භාණ්ඩාගාරය විසින් නම් කරන බලයලත් විගණකාධිකාරිවරු විසින් සමාගම විගණනය කරනු ලැබේ.

**පැරණි තොරතුරු**

| වසර | | ආයතනයේ නම |
|---|---|---|
| සිට | දක්වා | |
| 1938 | 1965 | ලුණු දෙපාර්තමේන්තුව |
| 1966 | 1990 | ශ්‍රී ලංකා ජාතික ලුණු සමාගම |
| 1991 | 1996 | ලංකා ලුණු සමාගම |
| 1997 | 2001/Sept. | මන්නාරම ලේවාය -දිස්ත්‍රික් ලේකම් යටතේ |
| 2001/Oct. | Up to date | මන්තයිලුණුසමාගම. (උතුරු පළාතේ ලේවායන්) |

## අපේ දැක්ම



වෙනත් ක්‍රියාවලීන් සමඟ සම්බන්ධ ස්වභාවික සම්පත් ගවේෂණය කරමින් උතුරු ශ්‍රිත ව්‍යවසායන් සංවර්ධනය කිරීම හා එමගින් ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම.

## අපේ මෙහෙවර

“ලුණු ලේවායන් මෙහෙයවීම, නිෂ්පාදනය, අගය එකතු කිරීම සහ ලුණු සහ අතුරු නිෂ්පාදන අලෙවි කිරීම"

## 4.2 නිෂ්පාදන අංශ පිළිබඳ තොරතුරු

### (අ) මන්නාරම් ලේවාය

මන්නාරම් ලුණු ලේවායේ මුළු නිෂ්පාදන ප්‍රදේශය අක්කර 163 කි.වාර්ෂික ලුණු නිෂ්පාදනය ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් 5500 ක් පමණ වන අතර මෙය ශ්‍රී ලංකාවේ ලුණු මුළු නිෂ්පාදනයෙන් සියයට 5 ක් වේ.නුදුරු අනාගතයේ මන්නාරම් ලුණු ලේවාය තව දුර සංවර්ධනය කිරීමෙන් පසු 5 ක් වන වෙළඳ පොළ හිමිකාරිත්වය 5.5% දක්වා ඉහළ යනු ඇත.

එය ලාභ ලබන ආයතනයක් ලෙස ලාභය මගින් සේවක වැටුප් හා සුභසාධනය සමග යම් සංවර්ධන හා නඩත්තු කටයුතු සිදු කිරීමට හැකිය. මේ අතර, ප්‍රධාන සංවර්ධන හා ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ආයතනය රජයේ හා අනෙකුත් ආධාරකරුවන් මත යැපේ.

### (ආ) එලිෆන්ට් පාස් ලේවාය

2001 දී එලිෆන්ට් පාස් පරිපාලනය කැබිනට් තීරණයකින් මන්තායි ලුණු සමාගම යටතට පත්විය. කෙසේ වෙතත්, ගැටුම්කාරි තත්ත්වය නිසාඑලිෆන්ට් පාස්ලේවායමන්තායි ලුණු සමාගමටපාලනය කළ නොහැකි විය (එල්.ටී.ටී.ඊ සංවිධානයේ පාලන ප්‍රදේශය යටතේ පැවතුණි). 2009 දී උතුරු ප්‍රදේශය මුදාගත් පසු, සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් පවරා ලන්නා ලද අතර රුපියල් මිලියන 100 ක් වටිනාකමනින් ලුණු ලේවායේ අක්කර 350 ක භූමි ප්‍රමාණයක අලුත්වැඩියා කටයුතු සිදුකරන ලදී. මේ අතර, 2015 දී දෙවන අදියර සඳහා කැබිනට් මණ්ඩලය රුපියල් මිලියන 125ක් අනුමත කර ඇත. 2015 සැප්තැම්බර් 21 වන දින නවතම ගැසට් නිවේදනය මගින්එලිෆන්ට් පාස් ලේවාය මන්තායි ලුණු සමාගමයටතට පත්කරනු ලැබ ඇත. මන්තායි සෝල්ට් සමාගම දැනට ව්‍යාපෘතියේ පළමු අදියර  අවසන්කරන ලද 2වන අදියර2016 දී ක්‍රියාත්මක කරයි. එලිෆන්ට් පාස් යනු උතුරු පළාතේ ඇති විශාල ලේවායකි. මුළු නිෂ්පාදන ප්‍රදේශය  අක්කර 700 ක් දක්වා ව්‍යාප්ත වී ඇති අතර නුදුරු අනාගතයේ දී මෙට්‍රික් ටොන් 20,000 ක් පමණ නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ.

**ඇ) වෙම්මනි ලුණුලේවාය**

වෙම්මනි ලුණුලේවාය සතු මුළු භූමි ප්‍රමාණය අක්කර 200 ක් වන අතර වෙම්මනි අක්කර 80 ක් ලුණු නිෂ්පාදනයට යොදා ගැනේ. පවත්නා සම්පත් භාවිතා කරමින් නිෂ්පාදන කටයුතු සිදු කරන ලදී. පසුගිය වසර කිහිපය තුළ, වෙම්මනි ලේවායේ කාර්ය මණ්ඩලය නිෂ්පාදනය සඳහා ඔවුන්ගේ උපරිම ශක්තිය භාවිතා කළහ. නමුත් දුර්වල පාංශු තත්ත්වයත් ප්‍රමාණවත් තරම් ගුණාත්මක බවකින් යුතු මුහුදුසුළඟ(quality sea braine) සහ යාබද ඉඩම්වලින් මිරිදිය ජලය කාන්දුවීමත් හේතුවෙන්අ පේක්ෂිත ප්‍රමාණය නිෂ්පාදනය කිරීමට නොහැකි විය.

ලේවායේ අඩු ඵලදායිතාවය නිසා වසර ගණනාවක් තිස්සේ පාඩු ලැබූ බැවින්මෙම ප්‍රදේශයෙන් ලුණු නිෂ්පාදනය 2012 වසරේ සිට අත්හිටුවා ඇත. දැන් එයප්‍ර තිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය යටතේ රජය හා පෞද්ගලික හවුල්කාරිත්වය මත (PPP) ජලජීවී වගා ව්‍යාපෘතියක් ( aquaculture project) සිදු කිරීමට අමාත්‍යාංශය යෝජනා කර තිබේ.

## 4.3 නිෂ්පාදන තොරතුරු

| වර්ෂය | නිෂ්පාදනය (මෙ.ටො) | | |
|---|---|---|---|
| | මන්නාරම | වෙම්මනි | එකතුව |
| 2011/2012 | 4147. | 135 | 4282 |
| 2012/2013 | 4527. | - | 4527 |
| 2013/2014 | 4653. | - | 4653 |
| 2014/2015 | 5219.8 | | 5219.8 |



## 4.4 විකුණුම්

| වර්ෂය | විකුණුම්(මෙ.ටො) | ආදායම(මිලි) රුපි. |
|---|---|---|
| 2011/2012 | 4016 | 43.5 |
| 2012/2013 | 3801 | 38.9 |
| 2013/2014 | 4498 | 46.3 |
| 2014/2015 | 5176.1 | 49.0 |

## 5 සංවර්ධනය සිදුකරන ප්‍රධාන ප්‍රදේශ

**(අ) මන්නාරම් ලුණු**

1) වර්තමානයේ භාවිතා කරන ලුණු සකසන අයඩින් මිශ්‍රණ යන්ත්‍රය (crystal salt iodine mixing plant) 2004 දී UNDP විසින් පරිත්‍යාග කරන ලද අතර එය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙහි නිර්දේශය මත නව යන්ත්‍රයක් සවි කරන තෙක් යොදා ගැනේ. අප සමාගම විසින් පැයක දී මෙට්‍රික් ටොන් 02 ක නිෂ්පාදන ධාරිතාවයකින් යුතු වියළනයක් සහ කොටස්වලට වෙන් කිරීමේ හැකියාව සහිත නව යන්ත්‍ර මිලදී ගැනීමට සැලසුම් කර තිබේ.

2) සමාගම නිෂ්පාදනාගාරය සංවර්ධනය කිරීමට සමත් වුවද එහි පරිපාලන සංකීර්ණය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට නොහැකි වී ඇත. ප්‍රධාන කාර්යාලය තවමත් කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ලක පිහිටා ඇත. මන්නාරම කාර්යාල ගොඩනැගිල්ල 1950 දී ඉදිකර ඇති අතර එය කඩා ඉවත්කළ යුතු වේ. එම නිසා මන්නාරම් කාර්යාලය සඳහා ඉතාමත් කඩිනමින් ගොඩනැගිල්ලක අවශ්‍යතාවයක් පවතී. පරිපාලන ඒකකයේ පළමු අදියර සම්පූර්ණ කිරීම සඳහා රුපියල් මිලියන 12 ක් වෙන් කිරීම පිණිස මාන්තයි ලුණු සමාගම මුදල් අමාත්‍යාංශයට  වාර්තාවක් ඉදිරිපත් කර ඇත.

3) ලුණු සහ අයඩින් මිශ්‍රණ යන්ත්‍රය සංවර්ධනයෙන් පසු මෙට්‍රික් ටොන් 5500 සිට 6000 දක්වා අපේක්ෂිත ඉලක්කය සමග අලෙවිකරණ කටයුතු දියුණු කළ යුතුය. මාන්තායි සමාගමේ කළමනාකරණ මණ්ඩලය අලෙවිකරණ නිලධාරියෙකු පත්කිරීමේ ක්‍රියාවලියේ නිරත වන අතර එය මන්නාරම් ලේවායේ අලෙවිකරණ සහ පරිපාලන කටයුතු සඳහා පැන නැගී ඇති හදිසි අවශ්‍යතාවයක් සපුරාලීමකි.

**(ආ) අලි මංකඩ ලේවාය**

1. අක්කර 350 ක නිෂ්පාදනය ආරම්භ කිරීම සඳහා I - වන අදියරේ ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන කටයුතු සම්පූර්ණ කිරීම.
2. තවත් අක්කර 350 ක් තුළ නිෂ්පාදනය ආරම්භ කිරීම සඳහා අදියර II ව්‍යාපෘතියේ ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන කටයුතු.
3. කාර්යාල කාර්ය මණ්ඩලය හා සේවකයින් සඳහා නවාතැන් පහසුකම් සැලසීමට යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

**ඇ) වෙම්මනි ලුණු ලේවාය**

රාජ්‍ය සහ පුද්ගලික හවුල්කාරිත්වය මත ජලජීවී වගා ව්‍යාපෘතියක් වෙනුවෙන් අමාත්‍යාංශය සමඟ කටයුතු කරනු ලැබේ.

**5.1 සංවර්ධන කටයුතුවල ප්‍රගතිය**

- සුදු පැහැති අයඩීන් මිශ්‍ර ලුණු (crystalized salt) නිෂ්පාදනය හා අලෙවිය වෙළෙඳ පොළ ව්‍යාප්ත කිරීමට සහ පුළුල් කිරීමට උපකාර වන අතර එය සමාගමට වෙළඳපොළ තුළ රැදී සිටීමේ ශක්‍යතාව සහතික කරනු ඇත.
- ඉහළ හා වේගවත් අලෙවිය මගින් ගබඩා කිරීම හෝ තොග පවත්වා ගැනීමේ කාලය අඩු කරනු ඇත.
- පවත්නා කාර්ය මණ්ඩලයේ සේවා නියුක්තිය ආයතනික තිරසාරභාවය මගින් තහවුරු වන අතර පුළුල් කිරීමේ අවශ්‍යතා මත තවත් රැකියා අවස්ථා නිර්මාණය වනු ඇත.
- වැඩිවන ලාභය සේවකයින්ට සුබසාධන පහසුකම් සහ ප්‍රතිලාභ ලබා දීමට හේතු වනු ඇත.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අවශ්‍යතා සපුරාලීම සහ ගුණාත්මකභාවය පවත්වා ගනු ඇත. සාධාරණ මිලක් යටතේ ග්‍රාමීය වෙළඳපොළෙහි නිපැයුම් පැවතීම මගින් අයඩීන් ඌණතාවයෙන් මිදීමට නිෂ්පාදිත හා සිල්ලර වෙළඳාම දායක වේ.
- එලිෆන්ට් පාස් ලුණු ලේවායේ ඉතිරි අක්කර 350 ක් අලුත්වැඩියා කරන අතර ක්ෂේත්‍ර කාර්යාලය, යාන්ත්‍රික මධ්‍යස්ථානය සහ පොම්පාගාරය වැනි අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කරනු ලබන අතර පළමු වසරේ මහ කන්නයේ දී මෙට්‍රික් ටොන් 8000 ක අස්වැන්නක් අපේක්ෂා කෙරේ.
- රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරිත්ව ජලජීවී වගා ව්‍යාපෘතියක් හරහා වෙම්මනි ලුණු ලේවාය යළි පණගැන්වෙනු ඇත.
- මහා භාණ්ඩාගාරයට සැලකිය යුතු ලාභාංශයක් ගෙවනු ලබන අතර, ජාතික සංවර්ධනය සඳහා අගය එකතු කිරීමේ බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු (VAT and NBT) වැනි බදු රජයට ලැබෙන අතර මෙම බදු අවසානයේ මහජනතාගේ ප්‍රතිලාභ වේ.

## 6. මූල්‍ය ක්‍රියාකාරිත්වයේ විශේෂ අවස්ථා

| මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | ඒකක | **2014/2015** | **2013/2014** | **2012/2013** | **2011/2012** | 2010/2011 |
|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදනය** | මෙ.ටො | 5220 | 4653 | 4527 | 4282 | 2930 |
| **අලෙවිය** | මෙ.ටො | 5176 | 4498 | 3801 | 4016 | 3143 |
| **ආදායම** | රුපි. | 49,018,196 | 46,348,727 | 38,820,175 | 43,586,657 | 28,751,016 |
| **දළ ලාභය** | රුපි. | 21,194,992 | 12,067,352 | 13,315,888 | 14,276,589 | 5,038,988 |
| **ශුද්ධ ලාභය** | රුපි. | 4,457,567 | 7,372,990 | 499,230 | 3,876,691 | 254,104 |
| **ශුද්ධ වත්කම්** | | | | | | |
| මුළු ජංගම නොවන වත්කම් | රුපි. | 99,767,254 | 115,373,334 | 106,601,764 | 105,859,472 | 86,225,431 |
| මුළු ජංගම වත්කම් | රුපි. | 23,177,470 | 22,840,106 | 27,616,701 | 25,621,000 | 22,454,607 |
| අඩුකළා- ජංගම නොවන වගකීම් | රුපි. | (8,251,015) | (5,298,833) | (3,189,514) | (3,352,662) | (3,129,082) |
| අඩුකළා- ජංගම වගකීම් | රුපි. | (5,216,777) | (1,605,556) | (7,092,891) | (8,820,338) | (11,304,289) |
| | | **109,476,932** | **131,309,051** | **123,936,060** | **119,307,472** | **94,246,667** |
| **කොටස් හිමියන්ගේ අරමුදල්** | | | | | | |
| නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය | රුපි. | 30,000,000 | 30,000,000 | 30,000,000 | 30,000,000 | 30,000,000 |
| සංචිත | රුපි. | 79,476,932 | 101,309,051 | 93,936,060 | 89,307,472 | |
| | | **109,476,932** | **131,309,051** | **123,936,060** | **119,307,472** | 94,246,667 |
| **රජයේ ආදායම** | | | | | | |
| ආදායම් බදු | රුපි. | 3,597,467 | 2,317,558 | - | - | 196,115 |
| **කොටසක ඉපැයුම** | රුපි. | 14.86 | 24.58 | 1.66 | 12.92 | 0.85 |

## 7. ප්‍රධාන කළමනාකාරිත්වය පිළිබඳ තොරතුරු

| | නම | තනතුර |
|---|---|---|
| 01 | බී.ඩී.එල්.එම්.ධර්මසේන මිය | වැඩ බලන සාමාන්‍යාධිකාරී (2014.04.21-2014.08.30) |
| 02 | එම්.ජේ.තුවාන් මන්සාල් මහතා | සාමාන්‍යාධිකාරී (2014.09.01-2015.03.31) |
| 03 | ඩී.එල්.සී.ඒ.ඥානරත්න මහතා | මූල්‍ය කළමනාකරු (2014.04.01-2014.08.31) |
| 04 | කිත්සිරි සෝමරත්න මහතා | මූල්‍ය කළමනාකරු (2014.11.01-2015.03.31) |
| 05 | එස්.ටොකලි මහතා | කළමනාකරු මන්නාරම ලේවාය (2014.04.01-2015.03.31) |
| 06 | ඒ.ක්‍රිෂෝදරන් මහතා | සහකාර නිෂ්පාදන කළමනාකරු (2014.04.01-2015.03.31) |
| 07 | එම්.එෆ්.ෆයිසාල් මහතා | සහකාර නිෂ්පාදන කළමනාකරු (2014.04.01-2015.03.31) |

## 08. ආයතනික ව්‍යුහය



## 8.1. මාන්තයි ලුණු සමාගමේ වර්තමාන කාර්ය මණ්ඩලය

| තනතුර | ප්‍රධාන කාර්යාලය | මන්නාරම |
|---|---|---|
| සාමාන්‍යාධිකාරී | 01 | - |
| | | |
| මූල්‍ය කළමනාකරු | 01 | - |
| කළමනාකරු- ලේඛාය | - | 01 |
| අභ්‍යන්තර විගණන නිලධාරි | 01 | - |
| සහකාර කළමනාකරු -ලේඛා | - | 02 |
| ලේඛා නිලධාරී | | 01 |
| ගබඩා භාරකරු | | 01 |
| කළමනාකරණ සහකාර | 03 | 06 |
| අධීක්ෂක | | 01 |
| රියදුරු | 01 | 01 |
| කාර්යාල සහායක | 02 | 02 |
| විදුලි කාර්මික | | 01 |
| පොම්ප ක්‍රියාකරු | | 03 |
| යාන්ත්‍ර ක්‍රියාකරු | | 01 |
| කම්කරු | | 07 |
| ආරක්ෂක මුරකරු | | 04 |
| **මුළු කාර්ය මණ්ඩලය** | **09** | **31** |

## 9. අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2015 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා විගණනය කරන ලද ශේෂ පත්‍රය සහ ආදායම් ප්‍රකාශය සමඟ ඔවුන්ගේ වාර්තාව ඉදිරිපත් කර ඇත.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ ලුණු නිෂ්පාදනය හා විකිණීමයි.

**මූල්‍ය ක්‍රියාකාරිත්වයේ විශේෂ අවස්ථා**

2015 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා

| | |
|---|---|
| **ලුණු අලෙවිය** | **රුපි.** |
| මන්නාරම ලුණු ලේවාය | 49,018,196 |
| මුළු පිරිවැටුම | **49,018,196** |
| විකුණුම් පිරිවැය | (30,671,951) |
| **දළ ලාභය** | **18,346,244** |
| **අදාල කාල සීමාව සඳහා ශුද්ධ ලාභය / (බදු පසු)** | **1,608,820** |
| **කොටසකට ඉපැයීම්** | **5.36** |

**<u>අධ්‍යක්ෂවරු</u>**

වසර තුළ සිටි සමාගමේ අධ්‍යක්ෂකවරුන් පහත දැක්වේ.

ආර්.කේ.එම්. සිහිබ්ඩීන් මහතා (සභාපති) (2014.04.01 සිට 2014.10.30)
එම්.එම්.අමීන් මහතා (සභාපති) (2014.11.01 සිට 2015.03.31)
එම්.අයි.එම්.මොහොමඩ් මහතා(ක්‍රි. අධ්‍යක්ෂ) (2014.04.01 සිට 2014.10.30)
එම්.කේ.එම්.සහබ්දීන් මහතා(ක්‍රි. අධ්‍යක්ෂ) (2014.11.01 සිට 2015.03.30)
උපාලි ගුණවර්ධන මහතා (2014.04.01 සිට 2014.04.30)
ජේ.මාසෙලස් පීරිස් මහතා (2014.04.01 සිට 2014.04.30)
එස්.ආර්.ඩබ්.එම්.ආර්.පි.සත්කුමාර මහතා (භාණ්ඩාගාරය) (2014.04.01 සිට 2014.12.31)
පී.ඒ.එස්.ඒ. කුමාර මහාතා (භාණ්ඩාගාරය) 2015.03.01 සිට 2015.03.31)
එම්.එච්.එම්.නියාස් මහතා (2014.04.01 සිට 2014.04.30)
එම්.ආර්.සාලි මහතා (2014.11.01 සිට 2015.01.31)
එම්.එම්.එම් උවායිස් මහතා (2014.11.01 සිට 2015.03.31)
එම්.වී.එස්.ජයසූරිය මහතා(2014.11.01 සිට 2014.12.31)

**<u>අධ්‍යක්ෂකවරුන්ගේ කොටස් හිමිකම</u>**

අධ්‍යක්ෂකවරුන් විසින් සමාගමේ කොටස් හිමිකමක් දරණු නොලැබේ

**<u>කොන්ත්‍රාත්වලින් අධ්‍යක්ෂකවරුන් ලබන පොළිය</u>**
සමාගමේ කිසිදු කොන්ත්‍රාත්තුවකින් අධ්‍යක්ෂවරුන්ට ඍජු හෝ වක්‍ර පොළියක් නොලැබේ.

**<u>විගණකවරු</u>**

සමාගමේ වත්මන් විගණකවරයා වන්නේ ශ්‍රී ලංකා විගණකාධිපති දෙපාර්තමේන්තුවය.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය අනුව**
**සමාගම් ලේකම්**

## 10. මාන්තයි ලුණු සමාගමේ
## කොටස් හිමියන් සඳහා ස්වාධීන විගණකගේ වාර්තාව

## 10.මාන්තයි ලුණු සමාගමේ කොටස් හිමියන් සඳහා ස්වාධීන විගණන වාර්තාව

### 1. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්තාව

2015 මාර්තු 31 දිනෙන් අවසන් දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ විස්තීරණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් කරුණු පිළිබඳ විස්තරාත්මක සටහන් ඇතුළත් මන්තායි ලූණු සමාගමේ("සමාගම") මූල්‍ය ප්‍රකාශන විගණනය කර ඇත.

### 2.මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වැරදි හෝ වංචා හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට හැකිවනු පිණිස අභ්‍යන්තර පාලනය තීරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ('මණ්ඩලය') වගකීම දරනු ලබයි.

### 3.විගණකගේ වගකීම

අපගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම අපගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුව මම විගණනය සිදු කළෙමු. ආචාර ධර්මීය අවශ්‍යතාවයන්ට අප අනුකූල වන බවට  සහ මූල්‍ය ප්‍රකාශනයන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව අර්ථකථනය කර තිබේ ද යන්න පිළිබඳව සාධාරණ සහතිකයක් ලබා දීමට විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට එම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සහ ගණන් පිළිබඳව විගණන සාක්ෂි ලබා ගැනීමට පටිපාටි ක්‍රියාත්මක කිරීම විගනනයට ඇතුළත් වේ. වංචා හෝ වැරදි හේතුවෙන්  මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම තක්සේරු කිරීම,  විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම තක්සේරු කිරීම් වලදී, මෙම තත්වයන් සඳහා යෝග්‍ය වන විගණන ක්‍රියාමාර්ග සැලසුම් කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ  අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ  විශ්ලේෂණය කිරීම සඳහා  යොදා ගන්නා ලද ව ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම  මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

අපගේ විගණන මතය සඳහා පදනම සැපයීමට  අප විසින් ලබාගත් විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ සුදුසු බව විශ්වාස කරමු.

### 4.මතය

2015 මාර්තු 31 වන දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සැබෑ සාධාරණ අදහසක් ලබා දෙන අතර එහි මූල්‍ය කාර්ය සාධනය සහ එහි මූල්‍ය ප්‍රවාහය අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව බවත් අපගේ මතය වේ.

**<u>5. වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තා කිරීම</u>**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය අනුව අපි පහත සඳහන් ලෙස සඳහන් කරමු.

අ) විගණනය පිළිබඳ මතය, විෂය පථය සහ සීමාවන් පදනම් කර ගෙන ඉහත පරිදි සඳහන් කර ඇත.

ආ) අපේ මතය:

- විගණනයට අවශ්‍ය සියලු විස්තර සහ පැහැදිලි කිරීම් ලබාගෙන තිබෙන අතර, සමාගම විසින් නිසි ගිණුම් වාර්තා පවත්වාගෙන ගොස් ඇති බව තවදුරටත් මාගේ පරීක්ෂාවලින් විද්‍යාමාන වේ.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශය, 2007 අංක 07 දරන සමාගම් පනතෙහි 151 වන වගන්තියෙහි ඇති අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

බී. ආර්. ඩී. සිල්වා සහ සමාගම
වරලත් ගණකාධිකාරිවරු
කොළඹ 05.

දිනය……….…...………

## 11. විගණනය කරන ලද මූල්‍ය වාර්තා 2014/2015

**මාන්තයි සෝල්ට් සමාගමෙහි 2015 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා විස්තීර්ණ ආදායම් වාර්තාව**

| | සටහන් | 2014/2015 | 2013/2014 |
|---|---|---|---|
| | | රුපි. | Rs. |
| ආදායම | (3) | 49,018,196.00 | 46,348,727 |
| විකුණුම් පිරිවැය | | (30,671,951.50) | (34,281,374) |
| දළ ලාභය | | 18,346,244.50 | 12,067,353 |
| මෙහෙයුම් ආදායම් | (4) | 2,623,393.99 | 8,674,130 |
| | | 20,969,638.49 | 20,741,483 |
| පරිපාලන වියදම් | | 15,618,271.95 | (9,342,631) |
| විකුණුම්බෙදා හැරීම් වියදම් | | (122,000.00) | (1,689,434) |
| මෙහෙයුම් ලාභය | | 5,229,366.54 | 9,709,418 |
| මූල්‍ය පිරිවැය | (5) | (23,080.00) | (18,870) |
| බද්දට පෙර ලාභය | (6) | 5,206,286.54 | 9,690,548 |
| ආදායම් බදු | (7) | (3,597,466.94) | (2,317,558) |
| බදුවලට පසු වර්ෂය සඳහා ලාභය | | 1,608,819.60 | 7,372,990 |

මාන්තයි සෝල්ට් සමාගමෙහි

**මාරුතු 31 නෙන් අවසන් වසර සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව**

| | සටහන් | 31.03.2015 රුපි. | 31.03.2014 රුපි. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ ,පිරියත සහ උපකරණ | 8 | 66,187,768 | 66,850,080 |
| මූල්‍ය වත්කම් | 9 | 33,579,485 | 23,072,826 |
| විලම්බිත ආදායම් වියදම් | 10 | 22,601,680 | 25,450,428 |
| | | 122,368,934 | 115,373,334 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 11 | 17,981,969.78 | 13,785,010 |
| වෙළෙඳ හා අනිකුත් ලැබිම් | 12 | 5,006,649.85 | 6,288,243 |
| මුදල් සහ මුදලට සමාන දෑ | 13 | 188,850.46 | 2,766,853 |
| | | 23,177,470.09 | 22,840,106 |
| **මුළු වත්කම්** | | 145,546,404.07 | 138,213,440 |
| **සාමාන්‍ය කොටස් සහ වගකීම්** | | | |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 14 | 30,000,000.00 | 30,000,000 |
| රජයේ ප්‍රදාන | | 55,869,677.00 | 55,869,677 |
| ප්‍රත්‍යාගණිත සංචිත | | 14,500,000.00 | 14,500,000 |
| ආදායම් සංචිත | 15 | 31,708,935.45 | 30,939,374 |
| **මුළු සාමාන්‍ය කොටස් (සහභාගය)** | | 132,078,612.45 | 131,309,051 |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විලම්බිත බදු බැරකම් | 16 | 3,037,973.29 | 1,488,929 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් | 17 | 5,213,042.00 | 3,809,904 |
| | | 8,251,015.29 | 5,298,833 |
| **ජංගම බැරකම්** | | | |
| වෙළෙඳ හාවෙනත්ගෙවිය යුතු දෑ | 18 | 3,341,895 | 2,790,790 |
| ගෙවිය යුතු ආදායම් බදු | 19 | 1,874,881 | -1,185,234 |
| | | 5,216,776 | 1605556 |
| **මුළු සහභාගය සහ බැරකම්** | | 145,546,404 | 138,213,440 |

මෙම මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

........................................

කිත්සිරි සෝමරත්න                                        දිනය 14.12.2015

මූල්‍ය කළමනාකරු

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලැබේ.අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදි.

| | **නම** | **අත්සන** |
|---|---|---|
| අධ්‍යක්ෂ | 1. එම්.එම්.අමීන් | |
| අධ්‍යක්ෂ | 2.පි.ඒ.එස්.ඒ.කුමාර | |

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ දිනය                14.12.2015

**මාන්තයි සෝල්ට් සමාගමෙහි 2015 මාරුතු 31 දිනෙන් අවසන් වසර සඳහා හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය**

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය<br>රුපි. | රජයේ ප්‍රදාන<br>රුපි. | ප්‍රත්‍යාගණිත<br>සංචිත<br>රුපි. | ආදායම් සංචිත<br>රුපි. | මුළු ගණන<br>රුපි. |
|---|---|---|---|---|---|
| 2013 අප්‍රේල් 01 දින ට ශේෂය | 30,000,000.00 | 51,740,318.00 | 14,500,000.00 | 23,566,383.36 | 119,806,701.36 |
| වාර්ෂික ශුද්ධ ලාභ | - | - | - | 7,372,990.49 | 7,372,990.49 |
| රජයේ ප්‍රාග්ධන දායකත්වය | - | 4,129,359.00 | - | - | 4,129,359.00 |
| ලාභාංශ 2013/2014 | - | - | - | - | - |
| 2014මාර්තු 31 දින ට ශේෂය | 30,000,000.00 | 55,869,677.00 | 14,500,000.00 | 30,939,373.85 | 131,309,050.85 |
| වාර්ෂික ශුද්ධ ලාභ | - | - | - | 1,608,819.60 | 1,608,819.60 |
| ලාභාංශ 2014/ 2015 | - | - | - | (839,258.00) | (839,258.00) |
| 2015 මාර්තු 31 දින ට ශේෂය | 30,000,000.00 | 55,869,677.00 | 14,500,000.00 | 31,708,935.45 | 132,078,612.45 |

**මාන්තයි සෝල්ට් සමාගමෙහි 2015 මාරුතු 31 දිනෙන් අවසන් වසර සඳහා මූලා ප්‍රවාහය පිළිබඳ වාර්තාව**

| | 2014/2015<br>රුපි. | 2013/2014<br>රුපි. |
|---|---|---|
| <u>මෙහෙයුම් කටයුතුවල මූලා ප්‍රවාහය</u> | | |
| මෙහෙයුම් ලාභය/(පාඩුව) බදුවලට පෙර | 5,206,287 | 9,690,548 |
| <u>ගැළපුම්</u> | | |
| ක්ෂයවීම් | 1,485,640 | 1,570,251 |
| ක්‍රමක්ෂය | 3,376,540 | 3,323,761 |
| පාරිතෝෂික වෙන් කිරීම් | 1,403,138 | 620,390 |
| බොල් ණය පොතෙන් ඉවත් කිරීම | 0 | 1,446,513 |
| ආදායම් බදු ලැබීම් පොතෙන් ඉවත් කිරීම | 1,185,234 | - |
| ගෙවීම් ලියා හැරීම | | (3,967,114) |
| වැට් බදු ලැබීම් පොතෙන් ඉවත් කිරීම | 3,348,681 | - |
| බෝනස් සඳහා ප්‍රතිපාදන | | 1,350,000 |
| ස්ථාවර තැන්පතු පොළි ආදායම | (1,598,825) | (1,751,901) |
| ස්ථාවර වත්කම් බැහැර කිරීම මත ලාභය | | (33,005) |
| | 9,200,409 | 2,558,895 |
| <u>කාරක ප්‍රාග්ධන වෙනස් වීම්වලට පෙර වර්ෂය සඳහා මෙහෙයුම් ලාභය</u> | **14,406,695** | 12,249,443 |
| <u>කාරක ප්‍රාග්ධන වෙනස් වීම්</u> | | |
| තොග වැඩිවීම/(අඩුවීම) | (4,196,960) | (225,911) |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම) | (1,281,593) | 4,332,289 |
| වෙළෙඳ හා වෙනත්ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම) | 551,105 | (4,302,102) |
| | (4,927,448) | (195724) |
| <u>මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල්</u> | 9,479,247 | 12,249,443 |
| ලාභාංශ ගෙවීම් | (839,258) | - |
| පාරිතෝෂික ගෙවීම් | (879,687) | (700,553) |
| WHT ගෙවීම් | (173,542) | (142,705) |
| | (1,892,487) | (843,258) |
| **මෙහෙයුම් කටයුතු ශුද්ධ මූලා ප්‍රවාහය** | 7,586,760 | 11,210,461 |
| <u>ආයෝජන කටයුතුවල මූලා ප්‍රවාහය</u> | | |
| දේපළ,පිරියත හා උපකරණ හා මිළ දී ගැනීම් | 807,618 | (479238.57) |
| ස්ථාවර වත්කම් බැහැර කිරීම ආරම්භ කිරීම | - | 41000 |
| ආයෝජන ඉවත් කර ගැනීම | 9316700.77 | - |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම | (21,360,114) | (13,194,339.00) |
| ස්ථාවර තැන්පතු පොලී ආදායම | 1,598,825 | 1751901 |
| ඉඩම් සංවර්ධන වියදම | (527,792) | 0 |
| **ආයෝජන කටයුතු වල ශුද්ධ මූලා ප්‍රවාහය** | (10,164,762) | (11,880,676) |
| <u>මුදල් වර්ෂය තුළ මුදල් හා මුදල්වලට සමාන</u> | | |
| <u>දෑවල ශුද්ධ වර්ධනය</u> | 2,578,003 | (670,216) |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදලට සමාන දෑ | 2,766,853 | 3,437,069 |
| වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ | 188,850 | 2,766,853 |
| <u>වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ විශ්ලේෂණය කිරීම</u> | | |
| බැංකු ගත මුදල් | 186,850 | 2,549,994 |
| අතැති මුදල් | 2000 | 216859 |
| | 188,850 | 2,766,853 |

**මාන්තයි සෝල්ට් සමාගම 2015 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා**

**මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්**

**1. සංස්ථාපිත තොරතුරු**

**1.1 වාර්තාකරණ ආයතනය**

මාන්තයි සෝල්ට් සමාගම යනු ශ්‍රී ලංකාව තුළ පිහිටි ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය යටතේ (සම්පූර්ණයෙන්ම රජය සතු) සංස්ථාපිත සීමිත වගකීම් සහිත සමාගමකි. සමාගමෙහි ලියාපදිංචි කාර්යාලය 21, 2/1 ඊ.එස්. ප්‍රනාන්දු මාවත, කොළඹ 06 සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය මන්නාරම ග්‍රෑන්ඩ් බසාර් හි ද පිහිටා ඇත.

**1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ක්‍රියාකාරකම්වල ස්වභාවය**

වසර තුළදී සමාගමේ ප්‍රධාන කාර්ය වූයේ ශ්‍රී ලංකාවේ දිගු ඉතිහාසයක් ඇති ලුණු නිෂ්පාදන කටයුතු සිදුකිරීමයි. එය සාමාන්‍ය ලුණු නිෂ්පාදනය කර ශ්‍රී ලංකාව තුළ අයඩින් සහිත ලුණු, ලුණු කැට සහ කාර්මික ලුණු ලෙස බෙදා හැරේ.

1.3 පිටු අංක (05) සිට (25) දක්වා වූ මූල්‍ය ප්‍රකාශ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය අංගයක් ලෙස අන්තර්ගත කර ඇත.

1.4 වර්ෂය අවසානයේ දී සේවක සංඛ්‍යාව 41 (2015) විය.

## 2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනය

**2.1 සාමාන්‍ය ප්‍රතිපත්ති**

**2.1.1 අනුකූලතා ප්‍රකාශය**

වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූල පිරිවැය මත සහ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි අවශ්‍යතා මත පදනම් ව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

**2.1.2 සකස් කිරීමේ පදනම**

සමාගමෙහි මූල්‍ය ප්‍රකාශයන් ඓතිහාසික පිරිවැය සම්මුතිය මත සකස් කර ඇත.

වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති නම්, සමාගම විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේ භාවිතා කළ ප්‍රතිපත්තිවලට අනුකූල වේ. වර්තමාන වර්ෂය සඳහා වන ඉදිරිපත් කිරීම් සමග ගැලපෙන පරිදි සංසන්දනාත්මක තොරතුරු අවශ්‍ය පරිදි නැවත වර්ගීකරණය කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන, සමාගමේ තොරතරු ඉදිරිපත් කිරීමේ මූල්‍ය ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් (රු.) ඉදිරිපත් කෙරේ.

අඛණ්ඩව ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමට සමාගමට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂකවරුන් විසින් තක්සේරු කර ඇති අතර ඔවුන් වෙළඳාම් අත්හිටුවීමට හෝ ඇවරකිරීමට අදහස් නොකරයි.

### 2.1.3 ඇස්තමේන්තු සහ තීන්දු භාවිතය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කළමනාකරණය අවශ්‍ය වන අතර එය ගිණුම් ප්‍රතිපත්ති භාවිතය හා වාර්තා කළ වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ප්‍රමාණයට බලපායි. තථ්‍ය ප්‍රතිඵල තක්සේරු ප්‍රතිඵල වලින් වෙනස් විය හැකිය.

තක්සේරු හා මූලික උපකල්පනයන් පදනම් වී ඇත්තේ ඓතිහාසික අත්දැකීම් සහ විවිධ තත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන අනාගත සිදුවීම්වල අපේක්ෂා ඇතුළුව අනෙකුත් සාධක මතයි.

කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යනු ලබන පදනම මත ඇස්තමේන්තු හා මූලික උපකල්පන විමර්ශනය කෙරේ. අනාගත කාල පරිච්ඡේදයක් තුළ බලපෑමට ලක්වන හා සංශෝධන කරන කාලසීමාව ගිණුම් ඇස්තමේන්තුවලට සිදු කරන සංශෝධන ලෙස පිළිගනු ලැබේ.

### 2.1.4 ප්‍රමාණාත්මකභාවය සහ සමහාරය

සමාන අයිතමයන්වල අඩංගු එක් එක් ප්‍රමාණායන් වෙන වෙනම මූල්‍ය ප්‍රකාශනයන්වල ඉදිරිපත් කරනු ලැබේ. අසමාන ස්වභාවයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් යුතු අයිතමයන් ප්‍රමාණාත්මක නොවේ නම් වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

### 2.1.5 වාර්තා කරන කාල පරිච්ඡේදයෙන් පසු සිදු කර ඇති දේවල්

වාර්තාකරණ දිනයෙන් පසු සිදු වූ සිදුවීම්වල ප්‍රමාණාත්මකභාවය සලකා බලා මූල්‍ය ප්‍රකාශයන්හි යෝග්‍ය වෙනස් කිරීම් හෝ අනාවරණය කිරීම් අවශ්‍ය අවස්ථාවලදී සිදු කර ඇත.

### 2.1.6 බදුකරණය

**අ) ප්‍රවර්තන බදු**

බදු අය කිරීම පදනම් වන්නේ බදු අය නොකෙරෙන භාණ්ඩ සඳහා ගැලපීම් කළ වාර්ෂික ආදායම මත වන අතර එය 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූල වේ.

**ආ) විලම්බිත බදුකරණය**

මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා භාවිතා කරන ලද වත්කම් සහ වගකීම් ප්‍රමාණයන් සහ බදු වාර්තාකරණ අරමුණු සඳහා භාවිතා කරන ලද ප්‍රමාණයන් අතර තාවකාලික වෙනස්කම් විලම්බිත බදුකරණය සඳහා සලකා බලනු ලැබේ. විලම්බිත බදු ගණනය සමාගම වාර්තා කරන ලද කාල

පරිච්ඡේදය අවසානයේ දී සිය වත්කම් සහ වගකීම් පියවා ගැනීමට හෝ පියවීමට බලාපොරොත්තු වන ආකාරය පිළිබඳ සිදුකරන බදු ප්‍රතිවිපාක සිදුකරන පිළිබිඹු කරයි.

ප්‍රවර්තන බදු වගකීම් සහ වත්කම් හිලව් කිරීමට නීත්‍යානුකූලව බලාත්මක අයිතියක් තිබේනම් විලම්බිත වත්කම් සහ බැරකම් හිලව් කෙරෙන අතර එකම බදු අධිකාරිය විසින් බදු අයකළ හැකි එකම ඒකකය මත බදු ගෙවීමට අදාළ වීම හෝ විවිධ බදු ආයතන ශුද්ධ පදනමක් මත ප්‍රවර්තන බදු වගකීම් හා වත්කම් නිරවුල් කිරීමට ඔවුන් අදහස් කරයි නම් ඔවුන්ගේ බදු වත්කම් සහ වගකීම් සමාලෝචනය කරනු ලැබේ.

විලම්බිත බදු වත්කම ලෙස සලකන්නේ අනාගත තාවකාලික වෙනස්කම් සඳහා භාවිතා කළ හැකි භාවිතා නොකරන ලද බදු හානි සහ මට්ටමක් දක්වා අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා භාවිතා කළ හැකි අනාගත බදු අය කළ හැකි ලාභයයි. විලම්බිත බදු වත්කම් එක් එක් වාර්තාකරණ දිනයන්හි සමාලෝචනය කරන අතර තවදුරටත් ලාභ නොලබ යි නම් මට්ටමකට අඩු කරන අතර අදාළ ප්‍රතිලාභය හඳුනාගනු ඇත.

විලම්බිත බදු වත්කම් සහ වගකීම් ගණනය කරනු ලබන්නේ තාවකාලික වෙනස්කම්වලට යොදා ගැනීමට බලාපොරොත්තු වන බදු අනුපාත අනුව වාර්තා කරනු ලබන දිනය මගින් සැලකිය යුතු පරිදි පනවන ලද හෝ පනවා ඇති නීති මත පදනම් කරගෙනය.

### 2.1.7 ණය ගැනුම් පිරිවැය

ණය ලබා ගැනීමේ පිරිවැය ඔවුන් වැය කරනු ලබන කාලය තුළ සිදු කරන ලද වියදමක් ලෙස පිළිගනු ලැබේ.

## 2.2 වත්කම් තක්සේරු කිරීම සහ ඒවායේ මිනුම් පදනම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වත්කම් ලෙස වර්ග කර ඇති වත්කම් මුදල් වන අතර ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලිය තුළදී හෝ එය වාර්තා කළ යුතු දිනයෙන් වසරක් ඇතුලත දී මුදල් බවට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

ජංගම නොවන වත්කම් යනු සමාගම වාර්තා කරන දිනය වන දින සිට වසරක් තුළ රඳවා තබා ගන්නා වත්කමය.

### 2.2.1 <u>මුදල් හා මුදල් වලට සමාන දෑ</u>

**මුදල් හා මුදල් වලට සමාන දෑ** ලෙස අර්ථ දක්වන්නේ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතායක් සහිත පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි වටිනාකම වෙනස්වීමේ

අවදානමකට යටත් ආයෝජනයි. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ **මුදල් හා මුදල් වලට සමාන දෑ** අතැති මුදල් හා ඉල්ලුම මත ආපසු ගෙවිය හැකි ශුද්ධ බැංකු අයිරා සහ බැංකු තැන්පතුවලින් සමන්විත වේ.

**<u>මුදල් ප්‍රවාහ ප්‍රකාශය</u>**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත්තේ "වක්‍ර ක්‍රමය" භාවිකා කොට ගෙනය. පොලී ගෙවීම්, පොලී ලැබීම් සහ ලාභාංශ ලැබීම් මෙහෙයුම් මුදල් ප්‍රවාහයන් ලෙස වර්ග කර ඇති අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණින් ලාභාංශ ගෙවීම් මූල්‍ය සම්පාදන මුදල් ප්‍රවාහයන් ලෙස වර්ග කර ඇත.

<u>2.2.2 **දේපළ, පිරියත හා උපකරණ**</u>

දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් ගණනය කරනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම් හා සමුච්චිත අපහරන අලාභ අඩු කිරීමෙනි.

වත්කම අත්පත් කර ගැනීම සඳහා කරන ලද සෘජු වියදම් පිරිවැයට ඇතුළත් වේ. ස්වයං නිර්මාණිත වත්කම්වල (self-constructed assets) පිරිවැයට පහත දෑ අතුළත් වේ.

- අමු ද්‍රව්‍ය පිරිවැය හා සෘජු ශ්‍රම;

- ඔවුන්ගේ අපේක්ෂිත කාර්යයන් සඳහා වත්කම් ක්‍රියාකාරි තත්ත්වයට ගෙන ඒමට සෘජුව දරන ලද වෙනත් වියදම්;
- වත්කම ඉවත් කිරීමට හෝ ස්ථාපිත කිරීමට සමාගම බැඳී ඇති විට, භාණ්ඩවල කොටස් ඉවත් කිරීම, ඒවා පිහිටි ස්ථානයෙන් ඉවත් කිරීම සහ නැවත ස්ථාපිත කිරීම සඳහා ඇස්තමේන්තු පිරිවැය;

මිලදී ගත් මෘදුකාංග අදාළ උපකරණවල අඛණ්ඩ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය එම උපකරණයේ කොටසක් ලෙස සලකා ප්‍රාග්ධනය සපයයි. දේපළ, පිරියත හා උපකරණ යන භාණ්ඩවල කොටසක් ප්‍රයෝජනවත් කාර්යකට යෙදා ගනී නම් ඒවා දේපළ, පිරියත හා උපකරණවල වෙනම අයිතම (ප්‍රධාන සංරචක) ලෙස ගණනය කෙරේ.

බැහැර කිරීම මත ඕනෑම ලාභයක් හෝ අලාභයක් (භාණ්ඩයේ අපහරණය හා ප්‍රාග්ධන ප්‍රමානය අතර වෙනස ශුද්ධ ආදායම ලෙස ගණනය කරනු ලැබේ) ආදායම් ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් ආදායමක් සලකනු ලැබේ. ප්‍රත්‍යාගණනය කළ(නැවත තක්සේරු කළ- Revalued) වත්කම් විකුණනු ලබන විට,

ප්‍රත්‍යාගණන අතිරික්ත සංචිතයට (revaluation surplus reserves) ඇතුළත් කර ඇති ඕනෑම මුදලක් රඳවාගත් ඉපැයීම්වලට මාරු කෙරේ.

**<u>පසු පිරිවැය</u>**

යම් දේපලකට හෝ උපකරණයකට අයත් අයිතමයක කොටසක් ආදේශ කිරීමේ පිරිවැය, එම අයිතමයේ සත්‍ය වටිනාකමක් ලෙස සලකන විට, එම කොටස තුළ ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා එන බවට විශ්වාස කළ හැකි නම්, එහි පිරිවැය විශ්වසනීයව මැනිය හැකිය. ආදේශ කරන ලද කොටසෙහි ගිණුම්ගත වටිනාකම (සත්‍ය වියදම) අත්හැර දමා ඇත. දේපල හා උපකරණවල දෛනිකව සේවා කටයුතු සඳහා වන වැය කරන ලද පිරිවැය දරන වියදම් ලෙස ආදායම් ප්‍රකාශය තුළ පිළිගනු ලැබේ.

**<u>අලුත්වැඩියා හා නඩත්තු වියදම</u>**

මූල්‍ය කාල සීමාව තුළ අලුත්වැඩියා හා නඩත්තු කටයුතුවලට දරනු ලබන වියදම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ දක්වනු ලැබේ. පවත්නා වත්කම්වල කාර්යක්ෂමතාව පිළිබඳ මැතදී කළ තක්සේරු ප්‍රමිතියට අතිරික්තව අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා විට සහ වත්කමේ හඳුනාගත හැකි කොටසක් අලුත්වැඩියා කරන විට ප්‍රධාන අලුත්වැඩියා කිරීම්වල පිරිවැය වත්කම්වලට ඇතුළත් කරයි. අදාළ වත්කම්වල ඉතිරි ආයු කාලය තුළ ප්‍රධාන නවීකරණයන් ක්ෂය කෙරේ.

**ක්ෂයවීම**

වත්කමට ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂිත පරිභෝජන රටාව සමීපව විදහා දක්වන හෙයින් වත්කම් හා උපකරණවල එක් එක් කොටසෙහි අයිතමවල ඇස්තෙම්න්තුගත ප්‍රයෝජනයට ගන්නා කාලය(සක්‍රීයආයු කාලය) තුළ ක්ෂයවීම ඍජු (සරල මාර්ග)රේඛීය පදනම මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ දැක්වේ. ඉඩම් ක්ෂය නොකරේ. වත්මන් සහ සංසන්දනාත්මක කාලයන් සඳහා ඇස්තෙම්න්තුගත සක්‍රීය ආයු කාලය පහත පරිදි වේ.

| **වත්කම් පංතිය** | | **පදනම** | | | | |
|---|---|---|---|---|---|---|
| සියලු ගොඩනැගිලි | වසර | 20 | ට | වැඩි | 05% | බැගින් |
| සියළුම කර්මාන්තශාලා හා යන්ත්‍රෝපකරණ | වසර | 10 | ට | වැඩි | 10% | බැගින් |
| සියළුමඋපකරණ | වසර | 10 | ට | වැඩි | 10% | බැගින් |
| සියලුම ගෘහ භාණ්ඩ | වසර | 10 | ට | වැඩි | 10% | බැගින් |

ක්ෂයකරීම් ක්‍රමය, සක්‍රීය ආයු කාලය සහ අවශේෂ වටිනාකම් එක් එක් වාර්තාකරණ දිනයන්හි නැවත සලකා බැලීම හා සුදුසු පරිදි සකස් කළ හැක.

**සිදු කරමින් පවතින ප්‍රාග්ධන වැඩ සටහන්**

සිදු කරමින් පවතින ප්‍රාග්ධන වැඩ සටහන් පිරිවැය අනුව දැක්වේ.

මේවා දේපළ, පිරියත හා උපකරණවල මෙන්ම පද්ධති සංවර්ධනය ට සෘජුව දරන ලද ප්‍රාග්ධන ස්වභාවයේ වියදම්ය.

**2.2.3 ක්‍රමක්ෂය**

ඉඩම් සංවර්ධන වියදම් පිරිවැය 10% බැගින් වසර 10 හිලව් කෙරේ.

**<u>2.2.4 කල්බදු</u>**

<u>මූල්‍ය කල්බදු</u>

